**හන්තාන 21 ස්තාපන උපදෙස්**

**හැඳින්වීම**

මෙම සටහන මඟින් හන්තාන ලිනක්ස් 21 ස්තාපනය සඳහා අවබෝධයක් ලබා ගැනීමට උපකාරි විය හැක.

**පද්ධති අවශ්‍යතා**

හන්තාන ලිනක්ස් 21 ස්තාපනය සඳහා ඔබට පහත අවශ්‍යතා සපුරා ගත යුතුවේ.

- CD හෝ DVD drive, Boot කිරීමට හැකි ආකාරයේ.
- අවම 1 GHz  හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත ප්‍රොසෙසර් එකක්.
- අවම 1GB හෝ ඊට වැඩි RAM ධාරිතාවක්.
- අවම 20GB (Hard Disk Space) හෝ ඊට වැඩි හිස් ඉඩ.

**Hanthana Linux 21 පිටපත් ලබා ගැනීම**

මේ සඳහා www.hanthana.org වෙත පිවිස බාගත කරගැනීමෙන් හෝ http://www.hanthana.org/get-dvd.php වෙත පිවිස නොමිලයේ බෙදාහරින්නකුගෙන් ලබා ගත හැකිය .

**දත්ත උපස්ථ කිරීම (Data Backup)**

පළමුව ඔබේ දත්ත වෙනත් ස්ථානයකට උපස්ථ (Backup) කර ස්ථාපනය අරඹන්න.

**පරිඝනකය පළමුව DVD තැටියෙන් හෝ USB Drive එක මාර්ගයෙන් Boot වීමට සැකසීම.**


පළමුව ඔබේ පරිඝනකයේ BIOS තුලට ඇතුල් වී එහි Boot Device වෙතින් First Boot Device යන්නට හන්තාන ලිනක්ස් ඇතුලත් DVD Drive එක හෝ USB Drive එක තෝරාගන්න .

ඔබ දැන් හන්තාන ලිනක්ස් 21 (සිංහරාජ) සංස්කරණය ස්ථාපනය කිරීමට සූදානම්.

Hanthana Linux මෙහෙයුම් පද්ධතිය ස්ථාපනය DVD තැටියක් ආධාරයෙන් සිදු කරන බැවින් ස්ථාපනයේ එක් පියවරක සිට ඊළඟ පියවරට යාමේදී යම් කාලයක් ගතවිය හැකියි (DVD තැටිය කියවීමට යන කාලය සහ පරිගණකයේ දෘඩාංග ගුණාංග අනුව). එවිට ඉවසීමෙන් අදාළ පියවර පූරණය (load) වන තුරු සිට එහි අඩංගු උපදෙස් අනුව ක්‍රියා කිරීමෙන් අපහසුවකින් තොරව ස්ථාපනය සිදු කිරීමට ඔබට හැකි වනු ඇත.


## පරිගණකයට පිවිසීම

Hanthana Linux DVD තැටියෙන් ඔබේ පරිගණකය ආරම්භ කරන්න. එවිට පහත පරිදි තිරයක් ලැබෙනු ඇති.





මෙම තිරයෙන් Start Hanthana 21 යන්න තෝරා Enter යතුර ඔබන්න.
ඔබ කිසිදු යතුරක් ඔබන්නේ නැතිව සිටියහොත් තත්පර 08 ක කාලයකින් පසු ස්වයංක්‍රීයව Hanthana Linux ආරම්භ වනු ඇත.

ඔබ **Hanthana Linux** ආරමභ කිරීම තෝරාගත් විට ලැබෙන තිරයේ පූරණය වීමේ ප්‍රගතිය පෙන්වන තීරුවක් දර්ශනය වනු ඇත.



## **Hanthana Linux** වැඩතලයට පිවිසීම හෝ ස්ථාපනය




මෙම පියවරේ දී හන්තාන Live CD එක භාවිත කරමින් හන්තාන ලිනක්ස් වෙත පිවිසීමට නම් Try Hanthana Linux මත ක්ලික් කරන්න.

එවිට පරිගණකයේ ස්ථාපනය වීමකින් තොරව ඔබට හන්තාන ලිනක්ස් පරිශීලනය කළ හැක. ඔබ ලිනක්ස් සඳහා නවකයෙක් නම් එළෙසින් Live CD භාවිතයෙන් හන්තාන ලිනක්ස් ගවේශණය කිරීම රෙකමදාරු කරයි.
එසේ නොමැතිව ස්ථාපනය කර ගැනිමට නම් Install to Hard Drive මත ක්ලික් කරන්න.

**මෙහිදි Try Hanthana Linux මත ක්ලික් කර වැඩතලයට මුලින් පිවිසෙමු. එහිදී පහත තිරය දිස් වෙයි.**


මෙම තිරය ඔබට වැඩතලයේ දී නැවත Install to Hard Drive අයිකනය භාවිතයෙන් හන්තාන ලිනක්ස් ස්ථාපනය සඳහා භාවිත කළ යුතු අයිකනය පෙන්වා දෙයි. මෙය Close කිරීමත් සමගම හන්තාන ලිනක්ස් වැඩතලයට පිවිසීමට හැකියාව ලැබේ.



## **Hanthana Linux** වැඩතලයට පිවිසීම

Hanthana Linux වැඩතලයට (desktop) පිවිසීමෙන් පසු ඔබට අවශ්‍ය නම් සාමාන්‍ය ආකාරයට හන්තාන භාවිත කරන්නට අවස්ථාව ලබා දෙයි.


ඉන් අනතුරුව ස්ථාපනය කිරිම සඳහා යොමු වීමට නම් Activities මත ක්ලික් කළ විට Install to Hard Drive අයිකනය පහත කිරයේ පරිදි දිස් වෙයි.




## හන්තාන ලිනක්ස් ස්ථාපනය


ඉහත තිරයේ දිස් වන  "Install to Hard Drive" අයිකනය මත ක්ලික් කරමින් ස්ථාපනය සඳහා යොමු වෙමු

## ස්ථාපනය භාෂාව තේරීම





ඉහත මෙනුවෙන් ස්ථාපනය භාෂාව තෝරා “continue“ බොත්තම ඔබන්න.


## ස්ථාපනය සාරාංශය




“DATE & TIME” ක්ලික් කිරීමෙන් දිනය සහ වේලාව වෙනස් කරගත හැක.




ඔබගේ වේලා කලාපය තෝරන්න. මේ සඳහා සිතියම මත අදාළ රට තෝරන්න. “Done“ බොත්තම ඔබන්න.



“INSTALLATION DESTINATION” ක්ලික් කිරීමෙන් ස්ථාපනය සඳහා දෘඩ තැටිය සකස් කරගත හැක.





උඩ ඇති දෘඩ තැටි අතරින් ස්ථාපනයට අදාල දෘඩ තැටිය තෝරාගන්න.

පහල ඇති Other storage Options මඟින් දෘඩ තැටිය පාර්ටිෂන් කරන ආකාරය තේරිය හැකිය.


- Automatically configure partition (ස්වයංක්‍රියව පාර්ටිෂන් සාදා ගනී.)
- I will configure partition (අපට අවශ්‍ය ආකාරයට පාර්ටිෂන් සාදාගත හැක.)

## Automatically configure partition

Automatically configure partition ලබාදුන්විට ඔබගේ දෘඩ තැටියේ ඉඩ නැතිනම් පහත ආකාරයේ කවුළුවක් දිස්වනු ඇත.




එහි “Reclaim space” බොත්තම ඔබන්න.





මෙහි දැක්වෙන පාර්ටිෂන් මෙනුවෙන් ඔබ හන්තාන ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන පාර්ටිෂන් එක තෝරා “Delete” බොත්තම ඔබන්න.


ඉන්පසු “Reclaim space” බොත්තම ඔබන්න.

## I will configure partition


I will configure partition ආකාරය තෝරා “Done“ බොත්තම එබුවිට පහත පරිදි කවුළුවක් දිස්වනු ඇත.





හන්තාන ස්ථාපනය කිරීමට දෘඩ තැටියේ ඉඩ වෙන්කර නැතිනම් Unknown (Windows ස්ථාපනය කර ඇති පාර්ටිෂන්) ක්ලික් කරන්න.



ඉන්පසු හන්තාන ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන පාර්ටිෂන් එක තෝරා “-” (Delete) බොත්තම ඔබන්න.




ඉන්පසු ලැබෙන කවුළුවෙන් “Delete It” බොත්තම ඔබන්න.



මෙහි “Click here to create them automatically” එබූවිට දෘඩ තැටිය ස්වයංක්‍රීයව පාර්ටිෂන් කරගනී. නැතහොත්, '+' බොත්තම ඔබා පහත පරිදි අපට අවශ්‍ය ආකාරයට පාර්ටිෂන් සාදාගත හැක.

**හන්තාන ලිනක්ස් ස්ථාපනය කිරීමෙදී සෑදිය යුතු පාටිෂන් සහ එම පාටිෂන්වලින් සිදු කරනා කාර්යයන්.**

| Mount point | File System Type | Size | Description |
|---|---|---|---|
| / | ext4 | 15GB පමණ | මෙය අනිවාර්යෙන් තැනිය යුතු පාර්ටිශන් එකකි. මේ නිසා අවම වශයෙන් 15GB පමණ ඉඩක් වෙන් කිරීම වඩා යෝග්‍ය වේ. නමුත් 16GB ට වඩා වැඩි ඉඩක් ලබා නොදෙන ලෙසට රෙකමදාරු කරයි. |
| /boot | ext4 | 500MB | අනිවාර්ය නැත. මෙහි සත්‍ය වශයෙන්ම වැය වන්නේ 30MB පමණ වේ. නමුත් පද්ධතිය upgrade කිරීමකදී මෙම පාර්ටිශනයේ වැඩි ඉඩක් තිබීම ගැටළුවකින් තොරව upgrade කිරීමට හේතු වේ. කෙසේ වුවත් 500MB ට වඩා වැඩි ඉඩක් මේ සඳහා වෙන් කිරීම අනවශ්‍යයි. මෙහි ඉතිරිවන ඉඩ ප්‍රමාණය ඔබේ පුද්ගලික භාවිත සඳහා යොදාගත නොහැක. |
| අදාල නොවේ | swap | 1GB | මෙය ඔබගේ RAM ධාරිතාව ප්‍රමාණවත් නොවන අවස්ථාවල දෘඩ තැටියේ කොටසක් RAM ලෙස භාවිතා කිරීමට ඇති පාර්ටිශන් එකයි. ඔබගේ RAM ධාරිතාව 1GB ට අඩු නම් එමෙන් දෙගුණයක් මේ සඳහා වෙන් කිරීම සම්මතයයි. මෙහි කිසිදු ඉඩ ප්‍රමාණයක් ඔබේ පුද්ගලික භාවිත සඳහා යොදාගත නොහැක. නමුත් පරිගණකයේ 2GB RAM තිබේ නම් 2GB ප්‍රමාණයක swap පාර්ටිශන් එකක් තනන්න. |


| | | | |
|---|---|---|---|
| /home | ext4 | අවශ්‍ය තරම් | අනිවාර්ය නැත. මෙය පරිශීලක දත්ත ගබඩා කරන පාර්ටිශන් එකයි. එම නිසා ඔබට කැමති ඉඩක් මේ සඳහා වෙන් කල හැක. මෙසේ වෙනම පාර්ටිශන් එකක් /home සඳහා තැනීමෙන්, පද්ධතිය වෙනත් පදධතියකට වෙනස් කිරීමේදී හෝ upgrade කිරීමේදී පරිශීලක දත්ත ආරක්ෂාකර ගැනීමට හැකි වීම සහ පරිශීලක අභිප්‍රේත (user preferences) එලෙසම භාවිතා කිරීමට (බොහෝ විට) හැකිවීම ආදී වාසි අත්වේ. ඔබගේ පුද්ගලික ලිපි, mp3 ගොනු, චිත්‍ර පට වැනි බොහෝ දෑ ඇත්නම් ඊට සරිලන ඉඩක් ලබා දෙන්න. |

සැ.යු. ඔබගේ පරිගණකය “BIOS Boot (UEFI)” තාක්ෂණය භාවිතා කරයි නම් ඒ සඳහා “BIOS Boot” පාර්ටිශන් එකක්ද සාදාගත යුතුවේ.
“Click here to create them automatically” එබුවිට දෘඩ තැටිය ස්වයංක්‍රීයව පාර්ටිෂන් කරගනී. එවිට “BIOS Boot” පාර්ටිශන් එකක් අවශ්‍යනම් එයද සාදාගනී.


'+' බොත්තම එබූ විට පහත පරිදි කවුළුවක් ලැබෙනු ඇත. එහි “Mount Point” එක තෝරා “Desired Capacity” හි එයට අවශ්‍ය ඉඩ ප්‍රමාණය ලබා දෙන්න.

උදා :- Mount Point - /
Desired Capacity - 15GB


ලෙස ලබාදෙන්න.






ඉන්පසු “Add Mount Point” බොත්තම ඔබන්න.





එලෙසම ඉතිරි පාර්ටිශන් ටිකත් සාදාගන්න.



MANUAL PARTITIONING
Done
HANTHANA 21 INSTALLATION
us
Help!
New Hanthana 21 Installation
SYSTEM
/
hanthana-root
13.97 GiB
hanthana-root
Mount Point:
/
Desired Capacity:
13.97 GiB
Device(s):
ATA QEMU HARDDISK (sda)
Modify...
ADD A NEW MOUNT POINT
More customization options are available after creating the mount point below.
Mount Point:
/boot
Desired Capacity:
500MB
Cancel
Add mount point
Update Settings
Note: The settings you make on this screen will not be applied until you click on the main menu's 'Begin Installation' button.
AVAILABLE SPACE
26.02 GiB
TOTAL SPACE
40 GiB
1 storage device selected
Reset All


MANUAL PARTITIONING
Done
HANTHANA 21 INSTALLATION
us
Help!
New Hanthana 21 Installation
SYSTEM
/boot
sda1
476 MiB
/
hanthana-root
13.97 GiB
sda1
Mount Point:
/boot
Desired Capacity:
476 MiB
Device(s):
ATA QEMU HARDDISK (sda)
Modify...
ADD A NEW MOUNT POINT
More customization options are available after creating the mount point below.
Mount Point:
swap
Desired Capacity:
2GB
Cancel
Add mount point
Update Settings
Note: The settings you make on this screen will not be applied until you click on the main menu's 'Begin Installation' button.
AVAILABLE SPACE
25.56 GiB
TOTAL SPACE
40 GiB
1 storage device selected
Reset All





පාර්ටිෂන් සාදාගත පසු “Done“ බොත්තම ඔබන්න.
ඉන්පසු ලැබෙන කවුළුවෙහි “Accept Changes” බොත්තම ඔබන්න.




ඉන්පසු නැවත ස්ථාපනය සාරාංශය වෙත පිවිසෙනු ඇත.





ඉදිරියට යාමට “Begin install” බොත්තම ඔබන්න.

## පරිශීලක සැකසුම

ඊළඟට පරිශීලක සැකසුම් කවුළුවට පිවිසෙනු ඇත.




“ROOT PASSWORD” එබීමෙන් ප්‍රධාන පරිශීලකගේ(root) මුරපදය සැකසිය හැකිය.




ඔබ පරිගණකය භාවිතයේදී සමහර කටයුතු සඳහා සුවිශේෂී අවසර ලබා ගැනීම අවශ්‍ය වේ. පරිශීලකයෙකු එක් කිරීමට, වෙනස් කිරීමට මැකීමට හෝ වෙනස් කිරීමට (add/delete/edit new user), ජාල සැකසුම (Network Settings) වැනි කටයුතු සඳහා මෙම සුවිශේෂී ප්‍රධාන ගිණුම අවශ්‍ය වේ.

ඔබගේ පරිගණකයේ මෙම සුවිශේෂී ප්‍රධාන පරිශීලකට එනම් root පරිශීලකට මුරපදයක් යෙදීමේ අවස්ථාව මෙම කවුළුවේ දී ලැබේ. එකම මුරපදය දී ඇති පෙළ කොටු (text box) දෙකෙහිම ඇතුළු කිරීමට සැලකිලිමත් වන්න. ඔබ ලබා දෙන මුරපදය මතකයේ රඳවා ගැනීමට අමතක නොකරන්න.


මුරපදය ලබාදුන් පසු “Done“ බොත්තම ඔබන්න.

මුරපදය දුර්වල මුරපදයක් නම් “Done“ බොත්තම දෙවරක් ඔබන්න.




“USER CREATION” එබීමෙන් නව පරිශීලක ගිනුමක් සැකසිය හැකිය.

මෙහිදී නව පරිශීලකයෙක් තැනීම සිදු කරන්න.




මෙහිදී පරිශීලකට ගිණුම සැදීම සඳහා ඔබට අවකාශ ලැබේ. පරිශීලක නාමය ඉංග්‍රීසි කැපිටකල් අකුරු රහිතව සැදීම ඔබට පහසුවනු ඇත. මුරපදයක් යෙදීමේදී එකම මුරපදය දී ඇති පෙළ කොටු (text box) දෙකෙහිම ඇතුල් කිරීමට සැළකිලිමත් වන්න. ඔබ ලබා දෙන මුරපදය මතකයේ රඳාවා ගැනීමට අමතක නොකරන්න.


ගිණුමක් සැදීම සඳහා පහත උදාහරණය සැලකිල්ලට ගන්න.

Username: sirimal


Full Name: Sirimal Ahinsaka

Password: ආයතනයක වැනි පොදු ස්ථානවලදී තමාගේ පරිශීලක නාමය රහස්පදය ලෙස භාවිත නොකරන්න

අදාල තොරතුරු නිවැරදිව ලබාදුන් පසු “Done“ බොත්තම ඔබන්න.
මුරපදය දුර්වල මුරපදයක් නම් “Done“ බොත්තම දෙවරක් ඔබන්න.




ඔබට ඔබගේ පරිගණකයේ Hanthana Linux මෙහෙයුම් පද්ධතිය ස්ථාපනයේ ප්‍රගතිය දිස් වනු ඇත. මේ සඳහා තරමක කාලයක් ගත විය හැක (එම කාලය ඔබගේ පරිගණකයේ දෘඩාංග ශක්‍යතාව මත පදනම්ව). ඒ නිසා ඉවසීමෙන් රැඳී සිටින්න. මෙම කාලය බොහෝ විට විනාඩි 30 ක් හෝ ඊට අවම විය හැක.




Hanthana Linux මෙහෙයුම් පද්ධතිය සාර්ථකව ස්ථාපනය වූ පසු "Quit" බොත්තම ඔබන්න.


**සුභ පැතුම්!**
**ඔබ සාර්ථකව Hanthan Linux මෙහෙයුම් පද්ධතිය ඔබගේ පරිගණකයේ පිහිටුවා අවසන්.**

## පරිගණකය යළිපණගැන්වීම

දැන් ස්ථාපනයට භාවිත කළ සජීවි තැටිය ධාවකයෙන් ඉවතට ගෙන පරිගණකය යළිපණගන්වන්න (Restart).




පරිගණකය යළිපණගැන්වූ විට පහත පරිදි Hanthana Linux පද්ධතියට ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දෙනු ඇත.





ඔබගේ ගිණුමට ප්‍රවේශ වීමට ප්‍රථම ඔබට අවශ්‍ය නම් වැඩතලය


- GNOME
- GNOME Classic
- GNOME on Weyland

වලින් කැමති වැඩතලයක් තෝරාගතහැක.





ඉන් පසු ඔබේ මුරපදය ලබා දී ප්‍රවේශ වෙන්න.








“Next“ බොත්තම ඔබන්න.





“Next“ බොත්තම ඔබන්න.




“Skip“ බොත්තම ඔබන්න.




“Start using Hanthana“ බොත්තම ඔබන්න.




## ආයුබෝවන් ! Hanthana Linux වෙත ඔබ සාදරයෙන් පිළිගනිමු.

හන්තාන ලිනක්ස් පද්ධතිය තුළ ඇති Desktop-Guide-and-FAQ බහාලුමේ අන්තර්ගතව ඇති H21-FAQ-Sinhala සටහන කියවීම මගින් හන්තාන ලිනක්ස් පිළිබඳ නිති ඇසෙන පැන සඳහා පිළිතුරු ලබා ගත හැකි අතර Gnome3-Desktop-Guide සටහන මගින් හන්තාන ලිනක්ස්හි ඇති Gnome වැඩතලය භාවිතය සඳහා මග පෙන්වීමක් එක් කර ඇත. ඊට අමතරව සයුර, විජේසෙකර සහ දමිළ යතුරු පුවරු සඳහා සැකැස්ම එක් කර තිබේ.

Hanthana Linux පිළිබඳ ඔබේ අදහස් සහ යෝජනා info@hanthana.org විද්‍යුත් ලිපිනයට දන්වා එවීමට කාරුණිකවන්න.

**Hanthana Linux පරිශීලක සමූහය** http://groups.google.com/group/hanthana-community වෙත එක් වීමෙන් හන්තාන ලිනක්ස් පිළිබඳ ඇති ගැටලු විසඳාගත හැක. සමූහයට ලිපි එවීමට පෙර සමූහයට සම්බන්ධ වන්න. ලිපි එවීම සඳහා hanthana-community@googlegroups.com ඉ-ලිපිනය භාවිත කරන්න.